අමාත්‍යාංශයේ නම - ආරක්ෂක අමාත්‍යාංශය

කමිටුවේ නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
ආපදා කළමනාකරණය සඳහා අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත මූලික කණ්ඩායමක් පිහිටුවා ආපදා කළමනාකරණය සඳහා අවම කිරීමේ සැලසුම් මෙම කණ්ඩායම මඟින් සකස් කළ යුතු බවට නිර්දේශ කෙරේ.	SENDA ප්‍රමුඛතා සහ දේශගුණික විපර්යාස පිළිබඳ ගිවිසුම් අනුගමනය කරමින් 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳී සිටින අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන් අදාළ නියෝග යටතේ ඒකාබද්ධ කරන ලදී.
පරිසර අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අවම කිරීමේ සැලැස්ම සහ අනුවර්තන සැලැස්ම අදාළ පාර්ශවකරුවන් විසින් පිළිපැදීම සහතික කිරීමට නිර්දේශ කෙරේ.	පරිසර අමාත්‍යාංශය විසින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීම ඉලක්ක ගත වූ අවම කිරීමේ සැලැස්මක් සහ දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම ඉලක්ක ගත වූ අනුවර්තන සැලැස්මක් හඳුන්වා දී තිබේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දේශගුණික විපර්යාස පිලිබඳ ලේකම් කාර්යාලයේ ජාතික අනුවර්තන සැලැස්ම සමඟ සම්බන්ධීකරණයෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කර ඇත.
දිගු නියඟ හා ජල විදුලි උත්පාදනයට සහ ගොවිජන කටයුතුවලට අහිතකර ලෙස බලපෑම් ඇති කරනු ලැබිය හැකි බවට අනාවැකි පලකරනු ලබන එල්නිනෝ (EI Nino) වල බලපෑම් අවම කිරීම සහ ඒ සම්බන්ධ පූර්ව සූදානම පිලිබඳ සාකච්ඡා කිරීම පිණිස පාර්ශවකරුවන්ගේ රැස්වීම් කැඳවීමට නිර්දේශ කෙරේ.	රටෙහි එල්නිනෝ සහ අදාළ ENSO (ENSO: එල් නිනෝ-දක්ෂිණ දෝලනය) බලපෑම් අධ්‍යයනය කිරීමට සහ ඒ පිළිබඳ පුරෝකථනයන් හා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමට පූර්ණ බලතල පැවරී ඇත්තේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙතය. පසුගිය අගෝස්තු මාසය තුළ එල්නිනෝ පිළිබඳ නිල ප්‍රකාශයක් නිකුත් නොවූ බැවින් බලපෑම නිල වශයෙන් පුරෝකථනය කර නොමැත. කෙසේ වුවද, මෙම කාලය තුළ රට තුල පවතිනු ඇතැයි පුරෝකථනය කරන ලද වියළි කාලගුණ තත්වය සැලකිල්ලට ගනිමින්, ඒ සඳහා සූදානම් වීමේ කටයුතු ආරම්භ කර ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ ජල විදුලි උත්පාදනය සහ කෘෂිකර්ම අංශයට සම්බන්ධ ආයතන සමඟ සහයෝගීතාවයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අවශ්‍ය සම්බන්ධීකරණය ඇතිකර ගැනීමේ අරමුණින් සහ අවම කිරීමේ සැලසුම් සකස් කිරීමේ අරමුණින් යුතුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙතින් දැනටමත් එල්නිනෝ සහ ඊට අදාළ ENSO පිළිබඳ නිල ප්‍රකාශයක් සහ ඔවුන්ගේ අනාවැකි නිකුත් කරන ලෙස ඉල්ලා ඇත.

මූල්‍ය හා පරිපාලන තීරණ ගැනීමේදී සහ ගරු ජනාධිපතිවරයාගේ සහභාගීත්වයෙන් ජාතික ආපදා කළමනාකරණ කවුන්සිලයේ රැස්වීම් කැඳවීමේ හා පැවැත්වීමේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට මුහුණපාන්නට සිදුවන දුෂ්කරතා මහහරවා ගැනීම පිණිස 2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමට නිර්දේශ කෙරේ.	ආපදා කළමනාකරණ අංශයේ විෂය පථය යටතේ සහ ගරු රාජ්‍ය අමාත්‍යවරයා යටතේ ඇති අදාළ ආයතන සමඟ ආපදා කළමනාකරණ අංශය විසින් සාකච්ඡා කිහිපයක් පවත්වා තිබේ. ඒ අනුව, ආරක්ෂක අමාත්‍යාංශයේ නීති උපදේශකවරයාගේ අධීක්ෂණය යටතේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.
සෑම වසරකම කළුගඟ පිටාර ගැලීම හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර තත්වය ඇති වන බැවින් කළුගඟෙහි ගංවතුර වැළැක්වීම සඳහා වහා විසඳුමක් සෙවීමට නිර්දේශ කෙරේ.	ජාත්‍යන්තර ආයතන කිහිපයක් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික විශේෂඥයින් විසින් කළුගං ද්‍රෝණියේ ගංවතුර අවම කිරීම පිළිබඳ තාක්ෂණික යෝජනා සකස් කර ඇත. එබැවින්, මෙම තොරතුරු වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට යෝජනා කර ඇත.

අත්සන් කළේ
රනිල් වික්‍රමසිංහ
ආරක්ෂක අමාත්‍ය